ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

# පුවත්පත් නිවේදනය

## ඉන්දියානු නාවික හමුදාවේ INS දිල්ලි නෞකාව කොළඹින් නික්ම යයි

ඉන්දියාව විසින් ස්වදේශීයව නිපදවන ලද ප්‍රථම Destroyer වර්ගයේ නෞකාව වන INS දිල්ලි නෞකාව සාර්ථක සුහද සංචාරයකින් අනතුරුව 2023 සැප්තැම්බර් 03 වන දින කොළඹින් නික්ම ගියේය.

2. ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා විසින් 2023 සැප්තැම්බර් 02 වන දින INS දිල්ලි නෞකාවේ දී ප්‍රිය සම්භාෂණයක් පවත්වන ලදී. කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. අමාත්‍යවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාපතිවරු සහ විවිධ ක්ෂේත්‍රවල අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ. මහ කොමසාරිස්තුමා පරිහරණයට සූදානම් මානුෂීය සහ ආපදා සහන කට්ටලයක් (ආරෝග්‍යා මෛත්‍රි) ශ්‍රී ලංකා රජයේ භාවිතය සඳහා කතානායකතුමාට භාර දුන්නේය.

3. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් කතානායකතුමා විශේෂ වෛද්‍ය කට්ටලය සඳහා ඉන්දීය රජයට ස්තුතිය පළ කළේය. එසේම එතුමා ඉන්දියාව විසින් 2022 වසරේදී ලබා දුන් පෙර නොවූ විරූ සහයෝගය ද සිහිපත් කළේය. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේ INS දිල්ලි නෞකාවේ සංචාරය කලාපයේ සමීපතම සමුද්‍රීය අසල්වැසි රාජ්‍යයන් ද්විත්වයක් වන ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින මිත්‍රත්වයේ ශක්තිමත් බැඳීම් සංකේතවත් කරන බවයි.

4. මෙම සංචාරය අතරතුර දී INS දිල්ලි නෞකාවේ අණදෙන නිලධාරී කපිතාන් අභිෂේක් කුමාර් මහතා බටහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරීතුමා හමු වූ අතර ඉන්දීය සාම සාධක හමුදා ස්මාරකය අභියසදී

නිර්භීත ඉන්දීය සෙබළුන්ට සිය උපහාරය ද පුද කළේය. නෞකාවේ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ යෝගා සහ වෙරළ පිරිසිදු කිරීම් වැනි විවිධ වැඩසටහන්වල නිරත විය. මෙයට අමතරව 2023 සැප්තැම්බර් 03 වන දින නෞකාව දිවයිනෙන් පිටත්ව යෑමෙන් අනතුරුව කොළඹට ඔබ්බෙන් සමුද්‍රීය සහයෝගීතා අභ්‍යාසයක් ද පවත්වන ලදී.

5. මෙම නෞකාව 2023 සැප්තැම්බර් 1 වන දින පාසල් දරුවන්ට සහ මහජනතාවට විවෘතව පැවතිණ. එසේම, ශ්‍රී ලංකා නාවික හමුදා සාමාජිකයන් සඳහා නැව හුරු පුරුදු කිරීමේ සංචාරයක් ද විවිධ වෘත්තීමය අන්තර්ක්‍රියා ද පැවැත්විණ.

6. මෙයට පෙර ඉන්දියානු නාවික හමුදාවේ ඛන්ජාර් නෞකාව 2023 ජූලි 28-31 දිනවල ත්‍රිකුණාමලයේ මෙහෙයුම් සංචාරයක නිරත විය. ඉන්දීය නාවික හමුදා නෞකා විසින් සිදු කරන ශ්‍රී ලංකා සංචාරයන්හි අරමුණ වන්නේ ඉන්දියාවේ කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය - SAGAR යන දැක්ම සහ “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය අනුව අසල්වාසි රාජ්‍යයන් දෙකෙහි මිත්‍රශීලී නාවික හමුදාවන් අතර සහෝදරත්වය සහ කාර්ය සහයෝගීතාවය ශක්තිමත් කිරීමයි.

***

***කොළඹ***
***2023 සැප්තැම්බර් 03***